දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2013 පරීක්ෂණය - 2015 මැයි/ජුනි
First Examination in Arts (External) 2013 – May/June 2015

සිංප්‍ර 1.2 - සාහිත්‍ය පරිචය
# SL 1.2 – Competence of Literature

කාලය පැය තුන යි

**පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
**නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.**

---

01. (අ) පහත සඳහන් ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත පද සියල්ලෙහි සරල තේරුම් සහිත ව එම ඡේදය වත්මන් ලිඛිත සිංහලයට නගන්න.

එක් දවසක් රජ්ජුරුවෝ දහවල් මෙහෙ නිමවා සැඳැල්ලෙහි සක්මන් කරන්නාහු, සී මැදුරු කවුළුයෙන්, එක් එළුවකු බල්ලෙකු හා මිත්‍ර සන්ථවය කරන්නා දුටහ. එළු වනාහි ඇත් හල ඇතුට ඉදිරියෙහි ලා ලූ තණ නොකන තුරු කන්නේ ය. ඉක්බිත්තෙන් ඇත්හලයෝ ඔහු තණ කන්නා දැක මරා පීහ. අඬ ගසා ගෙන යන්නා වූ ඔහු දැක, එක් ඇත්හලයෙක් ලුහු බැඳ ගොස් දණ්ඩෙකින් පිට අවුරා පහරක් ගැසී ය.

උම්මග්ග ජාතකය (සංස්.) සුචරිත ගම්ලත්
(ලකුණු 07 යි)

(ආ). පහත සඳහන් පද්‍ය පන්තියේ තද කළු අකුරින් මුද්‍රිත පද සියල්ලෙහි සරල තේරුම් සහිත ව එම පද්‍ය පන්තිය වත්මන් ලිඛිත සිංහලයට නගන්න.

අවර    ඇඳුරු මෙහෙසුරු රිවි දළ    නෙතින
නොහැර    දිනත දින මින්දදහු    වෙසෙසින
පැතිර    නැගුණු නල සිළු ගිනි රොන්    ලෙසින
එතර    පෙනේ සඳ වෙල තුරු    මඳ-මදින

ගිරා සන්දේශය (සංස්) සුචරිත ගම්ලත්
(ලකුණු 07 යි)

(ඇ) පහත සඳහන් උද්ධෘතවල සරල තේරුම් ලියන්න.

1. ලප නොම වන් සඳ සේ සොමි ගුණෙනා
2. උදුල කරවන අවිඳු ගනඳුරු
3. පතළ නැණ යුතු වෙමි මම නිසයුරු
4. දුලා නෙතු-පුලා දිසි ස්වර්ණලතා සේ මෙළඳා
5. චණ්ඩාතප ඛණ්ඩිත වේ හිරු රජිඳුගෙ
6. වන් මෙ අරන්නේ - මන් බිය වන්නේ
7. නන්දන මා හිමි වූ නරනින්දේ

මනමේ නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර
(ලකුණු 07 යි)

(ඈ) පහත දැක්වෙන පද්‍ය පන්තිය විචාරයට ලක් කරන්න.

හිරු නිදයි

මා ළඟ ඉඳ හඬනු ඇසිණ
කව්දැයි ඇයිදැයි නොදැනිණි
සුරා සොඬුන් සැතපෙන්නේ
තින්දේ පත්ලටත් යටිනි

පුංචි දුවේ ඔබ හැඬුවේ
මගෙ කඳුලින් බව දැනුණේ
කප් සුවහස් ගණන් පැවති
රැයක් ගෙවී ගිය පසුව ය

ඔබේ ලොවට පායන හිරු
මා බැවි මට අමතක විය

රන් තැටියක කඳුළු - දයාසේන ගුණසිංහ

(ලකුණු 07 යි)

02. 'උමංදාව' කතුවරයා ස්ත්‍රී චරිත නිරූපණයෙහි ලා දැක්වූයේ කෙබඳු දක්ෂතාවක් දැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

03. 'ප්‍රේමයේ සත්‍ය කතාව ප්‍රේම වෘත්තාන්තයක ව්‍යාජයෙන් ශ්‍රී ලාංකේය සමාජ දේශපාලන විකාශනයේ එක් වකවානුවක් මැනවින් නිරූපණය කරයි.' විමසන්න.

04. 'අනේ එවිපත සිදු වුණි නොදනිමි කාගෙ දොසා' යන පාඨය කේන්ද්‍ර කොටගෙන මනමේ නාටකයේ ඛේදවාචකය ඔබ දකින්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

05. 'ගිරා සන්දේශ කතුවරයා සොබාදහම පිළිබඳ තම අභිරුචිය වඩාත් ප්‍රබල ලෙස කියා පෑමට උත්සාහ ගන්නේ 'වන වැණුමෙහි' දී ය.' නිදසුන් දෙමින් පහදන්න.

06. යසෝදරාවත අවසානයේ එන උපදේශාත්මක පද්‍ය පන්ති කිහිපය සමස්ත කාව්‍යය සමග සම්බන්ධ වන්නේ ද නොවන්නේ ද යන වග සනිදර්ශන ව පැහැදිලි කරන්න.

(02 සිට 06 දක්වා ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)